**උපායශීලී නගර සංවර්ධන ව්‍යාපෘතිය - 2016**

**-----------------------------------------------------**

උපායශීලී නගර සංවර්ධන ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 සැප්තැම්බර් 12 දින එළඹි අංක 5428 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 11 (ආ) (3) වගන්තිය සහ 2016 ජූලි 20 දින එළඹි අංක 5800 - එල්කේ දරන අතිරේක මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**-----------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, එවකට නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සහභාගීත්ව නගර කලාපවල තෝරාගත් නාගරික සේවා සහ පොදු නාගරික ස්ථාන වැඩිදියුණු කිරීමයි. ඒ අනුව ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කළ යුතු සහභාගීත්ව නගර කලාප ලෙස මහනුවර නගරය හා ගාල්ල නගරය තෝරා ගෙන තිබුණි. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 25,162.48 කට සමාන විගැහි (SDR) මිලියන 95 (එ.ජ.ඩො මිලියන 192.08) ක් වූ අතර ඉන් රු.මිලියන 19,257 කට සමාන එ.ජ.ඩො මිලියන 147 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. එසේම, 2016 ජූලි 20 දිනැති අංක 5800 - එල්කේ දරන අතිරේක මූල්‍යායනය සඳහා වූ මූල්‍ය ගිවිසුම අනුව, රු.මිලියන 7,975 කට සමාන විගැහි (SDR) මිලියන 39.90 ක් (එ.ජ.ඩො මිලියන 65) යාපනය නගරය සංවර්ධනය සඳහා සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි.

ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 05 දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය. අතිරේක මූල්‍යයන පහසුකම් යටතේ යාපනය නගරය සංවර්ධනය කිරීමේ කටයුතු 2021 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ

අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා  පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව හා 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි ද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඕ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

#### 2.2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------

ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ 10 වගන්තිය ප්‍රකාරව මධ්‍ය ප්‍රතිඵල දර්ශක ප්‍රකාශනයක් පිළියෙල කර නොතිබුණි. ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ 33 (ඊ) ඡේදයේ සඳහන් ප්‍රසම්පාදන කාර්යසාධන දර්ශකයන් පදනම් කරගෙන ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රගතිය ඇගයීමට හැකිවන පරිදි ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ 24 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන පරිපාලන අත්පොතක් පිළියෙල කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

---------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

--------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ජා.සං.සං | | | | | | | |
| 5428 එල්කේ | 147.00 | 19,257.00 | 3,960.00 | 8.07 | 1,177.99 | 11.00 | 1,563.58 |
| 5800 එල්කේ | 65.00 | 7,975.00 | - | - | - | - | - |
| ශ්‍රී.ලං.ජ. | 45.08 | 5,905.48 | 1,850.00 | 3.08 | 446.99 | 4.09 | 559.72 |
| එකතුව | 257.08 | 33,137.48 | 5,810.00 | 11.15 | 1,624.98 | 15.09 | 2,123.30 |

(අ) ඉහත තොරතුරු අනුව, ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් වෙන්කරන ලද රු.මිලියන 19,257 කට සමාන එජඩො මිලියන 147 ක මුළු අරමුදල්වලින්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ දින සිට වර්ෂ 02 ½ ක් ඉකුත් වූ පසු 2016 දෙසැම්බර් 31 දිනට මුළු වෙන්කිරීමෙන් සියයට 07 ක් නියෝජනය වන රු.මිලියන 1,563.58 කට සමාන එජඩො මිලියන 11 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද, සමස්ත ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදී වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක ඉස්මතුකර දක්වමින් නිශ්චිත ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ ඉලක්ක සපුරා ගැනීම සඳහා වගකීම් පවරමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු වුවත් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම නිසා වෙන්කරන ලද අරමුදල් උපයෝජනය පහළ මට්ටමක පැවතුණි.

(ආ) තවද ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ II ඡේදය පරිදි ව්‍යාපෘතියේ වැඩ සැලැස්ම පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා විස්තරාත්මක අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා රජයේ අයවැය ඇස්තමේන්තුවේ කරන ලද රු.මිලියන 5,810 ක වෙන් කිරීමෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 1,624 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

ලබාගත් තොරතුරුවලට අනුව, මහනුවර හා ගාල්ල නගරවල තෝරාගත් නාගරික සේවා සහ පොදු නාගරික ස්ථාන වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණි. එසේ වුවත්, අතිරේක මූල්‍යයන වැඩපිළිවෙල යටතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ යාපනය නගරය සංවර්ධනය කිරීමේ කටයුතු 2016 දෙසැම්බර් 31 දින දක්වාම ආරම්භ කර නොතිබුණි. පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේම, අදාළ මහ නගර සභා, මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නියෝජිතයන් ඉහත සඳහන් කමිටුවට ස්ථිර පදනම මත පත්කර නොතිබුණි.

එබැවින් ඉහත සඳහන් නියෝජිතායතන අතර වගකීම් බෙදාහැරීම මඟින් ව්‍යාපෘතියේ මෙහෙයුම් පහසු කරගැනීම සඳහා කමිටු රැස්වීම්වලදී ඵලදායී තීරණයන් ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) කටුගස්තොට - මඩවල - දිගන මාර්ගය සහ මහනුවර ධර්මාශෝක යන මාර්ග නැවත ඉදිකිරීම් කොන්ත්‍රාත් වැඩ 2016 ජූලි මාසයේදී ආරම්භ කර තිබුණද, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන්, 2016 දෙසැම්බර් 31 දිනට එම ඉදිකිරීම්වල පිළිවෙළින් සියයට 27 ක් හා සියයට 9 ක පහළ කාර්යසාධනයක් පෙන්නුම් කෙරුණි. එසේම, මහනුවර නගරයේ පොළොව යටින් දිවෙන කිලෝ මීටර් 2 ක් දිගැති කානු පද්ධතිය 2016 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණද, එම දිනට එහි භෞතික ප්‍රගතියෙහි සියයට 25 ක පහළ අගයක් පෙන්නුම් කෙරුණි.

(ඇ) ව්‍යාපෘතියෙහි ආයතනික බලගැන්වීම් සහ ධාරිතා සංවර්ධන සංරචකය යටතේ කළ යුතුව තිබුණු කාර්යයන් සහ ගාල්ල මහනගර සභාවේ ප්‍රයෝජනය සඳහාවන ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) රු.මිලියන 609.72 ක් සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 4.07 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ උප ව්‍යාපෘතියක් මඟින් මහනුවර නගරයෙහි ක්‍රියාත්මක කර තිබුණු කොන්ත්‍රාත් 07 ක් සමාලෝචිත වර්ෂයතුළ නිම කිරීමට සැලසුම්කර තිබුණද, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2017 මාර්තු 31 දින දක්වා අවසන් කර නොතිබුණි.

(ඉ) එසේම, රු.මිලියන 2,690.11 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 17.96 ක පිරිවැයක් යටතේ මහනුවර නගරයෙහි ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණු වෙනත් ව්‍යාපෘති 07 ක්, ජාත්‍යන්තර සංවර්ධන ආයතනයේ එකඟතාවය නොලැබීම නිසා අවලංගු කර තිබුණි. මේ මඟින් හඳුන්වාදී තිබුණු රු.මිලියන 858.26 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 5.73 ක පිරිවැයකට සමාලෝචිත වර්ෂය තුළ අවසන් කිරීමට සැලසුම් කර තිබුණු උප ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

ප්‍රගති වාර්තා අනුව, රු.මිලියන 22,020 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 147 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ මහනුවර හා ගාල්ල නගරවල පුනරුත්ථාපන කටයුතුවලට අදාල කොන්ත්‍රාත් 76 ක් ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණු අතර, මෙයින් රු.මිලියන 5,190 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 34.65 ක වටිනාකමක් සහිත කොන්ත්‍රාත් 36 ක් 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රදානය කර තිබුණි. ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් වැඩවල අඩු ප්‍රගතියක් වාර්තා කිරීම පොදු ලක්ෂණයක් වූ අතර කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍යමය ශක්‍යතාවය ඇගයීමකින් තොරව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම, කොන්ත්‍රාත්කරුවන් විසින් ප්‍රමාණවත් නොවන කාර්මික නිලධාරීන් සංඛ්‍යාවක් සේවයෙහි යෙදවීම, සැලසුම් උපදේශකවරුන් පිළියෙල කළ සැලසුම්වල පැවති දෝෂ, ව්‍යාපෘතිය මඟින් උපදෙස් ලබාදීමේ ප්‍රමාදයන් යනාදී අඩුපාඩු කොන්ත්‍රාත් වැඩවල දුර්වල කාර්යසාධනය කෙරෙහි සෘජුව බලපා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් තවදුරටත් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුම් අනුව, අතුරු බිල්පත්වල වටිනාකම කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5 කට අඩු නොවිය යුතුය. එසේ වුවත්, මහනුවර ධර්මාශෝක මාවත ප්‍රතිසංස්කරණය කිරීම සහ මැද ඇල ප්‍රදේශයේ ගේබියන් බැමි ඉදිකිරීම සහ කොන්ත්‍රාත්වලට අදාලව, මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5 ට අඩු වටිනාකමින් යුතුව ඉදිරිපත් කළ බිල්පත් සඳහා කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් කොන්දේසි නොසලකා අනුමත කර ගෙවීම් කර තිබුණි.

(ආ) ව්‍යාපෘතියෙහි දුනුමඩලාව ජල පිරිපහදු යන්ත්‍රාගාරයෙහි ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතුවල දුර්වල ප්‍රගතිය පිළිබඳව උපදේශකවරයා විසින් වාර්තා කර තිබුණද, කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය කඩිනම් කිරීමට හෝ කොන්ත්‍රාත් ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හෝ අවශ්‍ය කටයුතු කර නොතිබුණි. තවද, මහනුවර නගරයේ ආතර් ඩෙක් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට මාස 9 ක කාලයක් ප්‍රමාද කර තිබුණද ඒ සඳහා රු.මිලියන 2.72 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4 මූල්‍ය පාලනය හා සම්බන්ධ ගැටලු

----------------------------------

රු.මිලියන 888.67 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 6.16 ක් වූ ආරම්භක ශේෂය සහ 2016 ජුනි 10 දින ලබාගත් රු.මිලියන 1,459.55 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 10 ක අග්‍රිමයද ඇතුලත් රු.මිලියන 2,348.22 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 16.16 ක මුදලින් රු.මිලියන 1,177 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 8.07 ක් පමණක් ව්‍යාපෘතියෙහි විශේෂ (ඩොලර්) ගිණුමෙන් සමාලෝචිත වර්ෂය තුළ ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. මෙම නිසා මූල්‍ය අවශ්‍යතාවයන් පිළිබඳ කරන ලද දුර්වල පුරෝකතනයන් හේතුවෙන් රු.මිලියන 1,324.56 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 8.09 ක මුදලක් විශේෂ (ඩොලර්) ගිණුමේ ප්‍රයෝජනයට ගැනීමකින් තොරව 2016 දෙසැම්බර් 31 දින දක්වා රඳවා තිබුණි.

### 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

මෝටර් රථ කුලී පදනම මත ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් අත්සන් කර තිබුණු ගිවිසුමට අනුව, මාසයකට උපරිම වශයෙන් කිලෝ මීටර් 2,500 ක් ධාවනය කළ යුතු අතර ඊට වැඩිවන කිලෝ මීටර් ප්‍රමාණය සඳහා අතිරේක ගාස්තුවක් ගෙවිය යුතු වේ. ඇතැම් වාහන උපරිම වශයෙන් ධාවනය කළ හැකි දුර ප්‍රමාණයට වඩා කිලෝ මීටර් 27,220 ක් අඩුවෙන් ධාවනය කර තිබියදී, වැඩිපුර ධාවනය කර තිබුණු කිලෝ මීටර් 157,052 ක් වෙනුවෙන්ද ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 6.06 ක් වැයකර තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.6 ඌන උපයෝජිත වත්කම්

--------------------------

ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 73.55 ක පිරිවැයකට 2016 නොවැම්බර් මාසයේදී මිලට ගෙන තිබුණු මෝටර් රථ 09 ක් භාවිතයට ගැනීමකින් තොරව 2017 මාර්තු 31 දින දක්වා මහනුවර මහනගර සභා පරිශ්‍රයෙහි රඳවා තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.7 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියෙහි අනුමත කාර්ය මණ්ඩලය තනතුරු 13 කට අයත් 152 ක කාර්ය මණ්ඩලයකින් සමන්විත වුවද, අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර හා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු ඇතුළුව ප්‍රධාන තනතුරු 07 ක්ද ඇතුළත් ප්‍රරප්පාඩු 75 ක් පිරවීමට වර්ෂ 2 කට වඩා වැඩි කාලයක සිට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. එසේම, සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු 22 ක් 2016 දෙසැම්බර් 31 දින දක්වා මාස 6 ක වැඩි කාලයක් පුරප්පාඩුව පැවතුණි. ඉහත සඳහන් කළ තනතුරුවල ඌණතාවයන් ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ පහළ මට්ටමක ප්‍රගතිය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) එසේම, කොන්ත්‍රාත් කළමනාකරණය හා නගර සැලසුම් කාර්යයන් සඳහා අවශ්‍ය පළපුරුද්ද නොමැති සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු යොදවා තිබුණි. තවද, කොන්ත්‍රාත් කළමනාකරණ ගැටලු විසඳීම සඳහා සහ ව්‍යාපෘතියේ කටයුතුවලින් බලපෑම් ඇතිකරන පුද්ගලයන් සමායෝජනය කිරීම සඳහා නියමිත සුදුසුකම් සහිත පුද්ගලයන් සමාජ ආරක්ෂක අරමුණින් යුතුව බඳවාගෙන නොතිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ව්‍යාපෘතිය විසින් දේශීය උපදේශකයන් 10 දෙනෙකු බඳවාගෙන ඔවුන්ගේ දීමනා ලෙස රු.මිලියන 20.52 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

**3.8 ඉඩම් අත්පත්කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ මූලික සැලසුම්වලට අනුව, රු.මිලියන 662 ක ඇස්තමේන්තුවක් යටතේ ඉඩම් කට්ටි 1,632 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණු අතර එයින් ඉඩම් කට්ටි 1,267 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අත්පත් කරගෙන තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය, ව්‍යාපෘතියෙහි කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ අඩු මට්ටමක ප්‍රගතිය කෙරෙහි බලපා තිබුණි.

(ආ) ඉඩම් අත්පත්කර ගැනීම සඳහා වූ එකතුව රු.මිලියන 378.46 ක වන්දි මුදලින්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වගන්තිය ප්‍රකාරව ගෙවිය යුතු වූ රු.මිලියන 83.08 ක් පමණක් ව්‍යවස්ථාපිත ගෙවීම් ලෙස ගෙවා තිබුණි. ඉතිරි රු.මිලියන 295.38 ක මුදල ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීම් කමිටුවේ නිර්දේශ පදනම් කරගෙන ගෙවා තිබුණි. එසේම, සහනදායී පදනම මත වන්දි ලැබී තිබුණු මෙම ඉඩම් හිමියන්ටම එකතුව රු.මිලියන 188.88 ක අතිරේක ගෙවීම් ගෙවීමට හේතුවූ කරුණු විගණනයට පැහැදිලි නොකෙරුණි.